# 01 පාඩම
# දේශපාලන විද්‍යාවේ ස්වභාවය, දේශපාලන අධ්‍යන ප්‍රවේශ

**සැකසුම :සාරංග හෙට්ටිආරච්චි**

- **ප්‍රශ්න අංක සිට ප්‍රශ්න වලට නිවැරදි කාණ්ඩය තෝරන්න.**

01. දේශපාලනය හදාරන්නා යනු,

A. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස අධ්‍යයනය කරන්නා වේ.

B. දේශපාලනය ප්‍රායෝගිකව කරන්නෙකු වේ.

C. දේශපාලනය කිරීමට වඩා වෙනත් කාර්යයක් කරන්නෙක

D. දේශපාලනය හැදෑරීමට අවශ්‍ය තේමා අධ්‍යයනය කරන්නෙකු වේ.

E. ප්‍රායෝගික වශයෙන් දේශපාලනය නොකලත් දේශපාලනය හදාරන්නෙකු වේ

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

02. දාර්ශනික ප්‍රතිමානීය අධ්‍යයන ප්‍රවේශය,

A. ලෝකයේ සිදුවීම් පිළිබඳව ගුණාත්මක ඇගයීම් කිරීමේ මිනුම් දඬු සපයා දේ.

B. ප්‍රතිමානීය ඉලක්ක ආනුභවික සාක්ෂි හා දත්ත මත ගොඩ නැගී තිබේ.

C. භාවිතා කරන සංකල්ප වල අර්ථ ගැඹුරින් ගවේෂණය කිරීම එහි එක් ලක්ෂණයක් වේ.

D. දේශපාලන ලෝකය පිළිබඳ අති මූලික ගැටලු මතු කරමින් ඒවා විභාග කරනු ලැබේ.

E. දේශපාලන චින්තන, විග්‍රහය ආයතන සහ භාවිත වල ප්‍රතිමානීය නිෂ්ඨාවන් හා කැපවීම ගැන උනන්දු වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

03. චර්යාවාදී අධ්‍යයන ප්‍රවේශයේ ප්‍රවණතා වන්නේ,

A. පුරවැසියන්ගේ දේශපාලනය සහභාගිත්වය අධ්‍යනය කිරීමට දැඩි උනන්දුවක් මෑත කාලය තුල ඇති වීම.

B. චර්යාවාදී ප්‍රවේශයේ වැදගත්කම අඩු වී දාර්ශනික ඓතිහාසික හා සමාජ විද්‍යාත්මක ප්‍රවේශවල වැදගත්කම ඉස්මතු වීම.

C. ඊට අනුරූපීව ආනුභවික හා ප්‍රත්‍යක්ෂමූලවාදී ගුරුකුලයේ අධිපතීත්වය වර්ධනය වීම.

D. චර්යාවාදයට එරෙහිව ගොඩ නැගුණු විවේචනයක් වූයේ දේශපාලන චර්යාව පමණක් අධ්‍යනයට ලක් කිරීම තුළින් දේශපාලන විග්‍රහයේ විෂය පථය පටු වන බවයි.

E. නව මාක්ස්වාදී, ලිබරල්, ස්ත්‍රීවාදී නූතනවාදී ධාරා වෙතින් චර්යාවාදය අභියෝගයට ලක් වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

04. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම

A. අවුරුදු දෙදහසකට වැඩි කාලයක් තුළ වර්ධනය වූවකි.

B. ග්‍රීසියේ ඇතැන්ස් නුවර ශාස්ත්‍රාලයක දේශපාලනය හැදෑරීම.

C. ප්ලේටෝ, ඇරිස්ටෝටල් කළ ප්‍රශස්ත මට්ටමේ අධ්‍යයනයක් සමග මෙය ආරම්භ විය.

D. ක්‍රි. පූ. 6 වන සියවස තෙක් ඈතට මෙහි ආරම්භය විහිදේ.



DO NOT COPY

E. විකාශනයේදී දේශපාලන අධ්‍යයනය විෂය පථය විධික්‍රම සහ ප්‍රවේශ ද පුළුල් විය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

05. දේශපාලනයේ යනු දේශපාලනඥයන්ගේ වෘත්තීයයි. එම අර්ථයෙන් බලන විට එම වෘත්තීයට අයත් කාර්යයන් වන්නේ,

A. මැතිවරණවලට තරග කිරීම

B. දේශපාලන ප්‍රචාරණ ව්‍යාපාර සංවිධාන කිරීම

C. දේශපාලනය පිළිබඳ ශාස්ත්‍රීය ඥානය ලබා ගැනීමට පෙළඹීම

D. මන්ත්‍රීවරුන්, ඇමතිවරුන්, අගමැති සහ ජනාධිපති වශයෙන් නිලතල දැරීම.

E. නීති සහ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහභාගී වීම

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

06. විද්‍යාත්මක හෙවත් චර්යාවාදී ප්‍රවේශයේ මූලධර්ම වන්නේ,

A. ආනුභවික පර්යේෂණ මත පදනම් වීම.

B. සමාජ දේශපාලන විග්‍රහය වාස්තවික වීම

C. වටිනාකම් විනිශ්චයන්ගෙන් යුක්ත වීම

D. ආනුභවික සහ වාස්තවික දත්ත මත පදනම්ව විශ්ලේෂණ නිරීක්ෂන සහ නිගමන ගොඩනැගිය යුතු වීම

E. වටිනාකම් විනිශ්චයන්ගෙන් නිදහස් ඥානය ප්‍රධානම මූලධර්මය වීම

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

07. දේශපාලන විද්‍යාව හැදෑරීමේ යන්නට අර්ථකථන කිහිපයක්ම තිබේ. එයට ඇතුළත් වන්නේ,

A. දේශපාලනය හා ඊට සම්බන්ධ පැතිකඩ ගැන ඉගෙන ගැනීම

B. පවතින න්‍යාය හා සංකල්ප විචාරයකට ලක් කිරීම

C. න්‍යාය සහ සංකල්ප ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිද යන්න අත්හදා බැලීම

D. අලුත් න්‍යාය හා සංකල්ප ගොඩනැගීම

E. පවත්නා දේශපාලන ප්‍රතිපත්ති හා ක්‍රම විචාරයට ලක් කරමින් නව විකල්ප යෝජනා කිරීම

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

08. දේශපාලන විද්‍යාව යන්නෙන් අදහස් වන්නේ පෞර රාජ්‍ය සම්බන්ධ විෂය අධ්‍යනය කරන ශාස්ත්‍රය විෂය ලෙස එකල හැඳින්විණි. ඒ අනුව පෞර රාජ්‍යවලට සම්බන්ධ විෂය කාරණා වලට අදාල තේමා වන්නේ,

A. රාජ්‍යයේ ස්වභාවය සහ අරමුණු

B. රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධය

C. පාලකයන්ගේ ගතිගුණ හා කුසලතා

D. ආණ්ඩුකරණ ක්‍රියාවලිය

E. පුරවැසියන්ගේ චෛතසිකය ක්‍රියා කරන ආකාරය

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

09. ආණ්ඩුකරණය යනු දේශපාලන විද්‍යා අධ්‍යනයට භාජනය වන දේශපාලනයේ ප්‍රධාන පැතිකඩකි. ආණ්ඩුකරණ ක්‍රියාවලියට අන්තර්ගත වූ කාර්යයන් වන්නේ,

A. නීති සම්පාදනය

B. ප්‍රතිපත්ති සම්පාදනය හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම



DO NOT COPY

C. නීතිය හා සාමය පවත්වාගෙන යාම

D. පෞද්ගලික ව්‍යාපාර කළමනාකරණය

E. අන්තර් රාජ්‍ය සම්බන්ධතා

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

10. දේශපාලනය ව්‍යවහාරික ඥානයක් ලෙස පුද්ගලයා ලබන අවබෝධය

A. ක්‍රමානුකූලව ලබාගන්නා දැනුමක් නොවේ.

B. එය උපතින්ම ලබාගන්නා දැනුමක් වේ.

C. එදිනෙදා ජීවිත අත්දැකීම් මත පදනම් වේ.

D. පදනම වන්නේ සමාජය සහ ලෝකය, පවුල, අසල්වැසියන් හා ජනමාධ්‍යයෙන් ලබන අවබෝධයයි.

E. ප්‍රායෝගික වශයෙන් දේශපාලනය නොකළත් දේශපාලනය හදාරන්නෙකු වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

11. දේශපාලනය ශාස්ත්‍රීය අධ්‍යයනයට ලක් කිරීම යනු දේශපාලනය යන පොදු ප්‍රපංචයේ සිට විවිධ පැතිකඩවල් අධ්‍යනයට ලක් කිරීමයි. එම පැතිකඩවල් වන්නේ,

A. දේශපාලන ආයතන

B. දේශපාලන භාවිතයන්

C. ආණ්ඩුකරණය

D. දේශපාලන මතවාද

E. දේශපාලන ව්‍යාකූලතාවයන්

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

12. කාල් මාක්ස්ගේ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය

A. ඓතිහාසික භෞතිකවාදය ලෙස ගොඩනගා ඇත.

B. එහි න්‍යායික සංකල්පයේ සමාජ සමස්තය නැතහොත් සමාජ සැකැස්ම ලෙස හැඳින්වේ.

C. සමාජ සැකැස්මේ උපරි ව්‍යුහය ස්වාධීනව වර්ධනය වන්නකි.

D. ඓතිහාසික වර්ධනයේ ගාමක බලවේගය වන්නේ පංති අරගලය යි.

E. පන්ති අරගලය සමාජය එකිනෙකට පසමිතුරු අභිලාෂ ඇති පන්තිවලට බෙදීමේ ප්‍රතිඵලයක් වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

13. දේශපාලනය,

A. බල අරගලය ක්‍රියාවට නංවන මාර්ගය වේ.

B. කවුරුන්, කුමක්, කෙලෙස, කුමන අවස්ථාවකදී ලබා ගන්නවාද යන්න තීරණය වීමේ ක්‍රියාදාමය වේ.

C. සමාජයේ පුරවැසියන් අතර පවතින්නා වූ භාවිතයකි.

D. පුරවැසි ක්‍රියාකාරීත්වය සහ සහභාගිත්වය පවතින්නක් වේ.

E. සමාජයේ ප්‍රභූන් විසින් කරනු ලබන ක්‍රීඩාවක් වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

14. දේශපාලන විද්‍යාව,

A. දේශපාලනයේ විවිධ පැතිකඩ අධ්‍යයනය කරන ශික්ෂණ මාධ්‍යය වේ.

B. දේශපාලන ප්‍රපංචයක් හෝ ගැටලුවක් විද්‍යාත්මක ලෙස අධ්‍යනය කිරීමක් වේ.

DO NOT COPY

සාරංග හෙට්ටිආරච්චි
(BA(sp),MA, Political Science – University Of Kelaniya)

C. විද්‍යාත්මක ක්‍රම මඟින් පමණක් අධ්‍යයනය කළ යුතු බව පිළිගනු ලබන විෂයක් වෙයි.

D. අතිශය පැරණි විෂයක් වන අතර ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේ ක්‍රමානුකූලව අධ්‍යනය කිරීම ඇරඹුණි.

E. න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශපාලනය යනුවෙන් කොටස් දෙකකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

15. චර්යාවාදී ප්‍රවේශය

A. ප්‍රාමාණිකරණය කළ හැකි දත්ත රැස් කිරීම හා සම්බන්ධ වේ.

B. වටිනාකමින් විනිශ්චයන්ගෙන් නිදහස් ඥානය මත පදනම් වේ.

C. ආත්මීය නිගමන, විශ්වාස හා අගති යනාදියෙන් නිදහස් වේ.

D. විසිවන සියවසේ මුල් කාලය තුළදී නව මාක්ස්වාදීන් විසින් අධ්‍යයන ප්‍රවේශයක් ලෙස ආරම්භ කෙරිනි.

E. විධිමත් හා නිරවද්‍ය විධික්‍රම අධ්‍යයනය කාර්යයේ දී භාවිතා කරනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

16. ස්ත්‍රීවාදී ප්‍රවේශය,

A. ශාස්ත්‍රීය ධාරාවක් ලෙස ගොඩ නැගෙන්නේ 1970 දශකයේදී ය.

B. දේශපාලන විද්‍යා විෂය පථයට ස්ත්‍රී පුරුෂ සමාජභාවය එක්කර තිබේ.

C. දේශපාලනය යනු පෞද්ගලික පරිමණ්ඩලයේ සිදුවන ක්‍රියාවක් බව පෙන්වා දී තිබේ.

D. ලිබරල්වාදය හා මාක්ස්වාදය අතර දෝලනය වන ප්‍රවේශයකි.

E. රාජ්‍ය සම්බන්ධ විශේෂ න්‍යායක් ලෙස නූතනයේ භාවිතා කරනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

17. දේශපාලන විද්‍යාව හැදෑරීමේ දී සැලකිලිමත් වන්නේ,

A. දේශපාලනය සහ ඊට සම්බන්ධ පැතිකඩ ඉගෙනගැනීම

B. පර්යේෂණ කිරීම සහ විග්‍රහ කිරීම

C. පවතින න්‍යාය හා සංකල්ප විචාරයට ලක් කිරීම

D. සමාජ බලය ක්‍රියාවට නංවන ක්‍රියාකාරිකයින්ගේ පෞද්ගලික චර්යාව හැදෑරීම

E. අලුත් න්‍යාය හා සංකල්ප ගොඩනැගීම

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

18. දේශපාලන විද්‍යාව

A. ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේ සම්භාව්‍ය ග්‍රීසියෙන් ආරම්භ වූවකි.

B. ප්‍රවේශ, න්‍යාය සහ විධික්‍රම අතින් බහුවිධ වේ.

C. ප්ලේටෝ, ඇරිස්ටෝටල් යන දාර්ශනිකයන් විසින් ආරම්භ කරන ලද විෂයයි.

D. දේශපාලනය කිරීම යන පොදු අර්ථයෙන් යුක්තය.

E. දේශපාලනයේ විවිධ පැතිකඩ අධ්‍යනය කරන ශික්ෂණ මාධ්‍යය වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

19. දේශපාලනය,

A. බල අරගලයේ ප්‍රායෝගික පැතිකඩ වේ.

B. මැතිවරණ, විරෝධතා, කැරලි ආශ්‍රයෙන් සිදු කරන ක්‍රියාදාමය වේ.

C. දේශපාලන පක්ෂ සහ දේශපාලන සංවිධානවල ක්‍රියාකාරීත්වය වේ.

D. ප්‍රජාතන්ත්‍රවාදීව හෝ ප්‍රජාතන්ත්‍රවාදී නොවන මාධ්‍යයන්ගෙන් සිදු වේ.



DO NOT COPY

E. දේශපාලන විද්‍යාව සමඟ අනන්‍ය සම වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

20. දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය,

A. දේශපාලන විද්‍යාව අධ්‍යයනයට මුලින්ම යොදා ගත් ප්‍රවේශය වේ.

B. මෙම ප්‍රවේශය පිළිබඳ ඉදිරිපත් කරන්නන් දේශපාලන දාර්ශනිකයන් වීම.

C. ලෝකය පිළිබඳ අති මූලික ප්‍රශ්න විභාග කරන ප්‍රපංචයක් වීම.

D. අගය කිරීම් වලින් තොරව සිදුකරන අධ්‍යන ප්‍රවේශයක් වේ.

E. දේශපාලන සංකල්පවලට ගැඹුරු අර්ථ කථන සපයන ප්‍රවේශයකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

21. විද්‍යාත්මක ප්‍රවේශය,

A. 1930 දශකයේදී ඇමරිකානු දේශපාලන විද්‍යාඥයන් අතර ප්‍රචලිත වීම

B. වටිනාකම් විනිශ්චයන්ගෙන් තොර ප්‍රවේශයකි.

C. 1970 දශකයේදී වඩාත් වර්ධනය වූ ප්‍රවේශයකි.

D. ආනුභවික පර්යේෂණ මත නිගමන ගොඩනගනු ලබන ප්‍රවේශයකි.

E. ස්වභාවික විද්‍යා විධි ක්‍රමයෙන් සමාජ විද්‍යාවන්ට පැමිණි ප්‍රවේශයකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

22. දේශපාලනය,

A. බලය සඳහා කරනු ලබන අරගලය ලෙස සැලකේ.

B. සමාජ, ආර්ථික සහ දේශපාලන ගැටලු පිළිබඳ නොඑකඟතාවයන් හි ප්‍රතිඵලය වේ.

C. ප්‍රශ්නාර්ථ ගැටලු විසඳීමට රාජ්‍ය බලය යෙදවීම හා සම්බන්ද වේ.

D. මහත්වරුන් විසින් පමණක් රඟදක්වන ක්‍රීඩාවක් ලෙස සැලකේ.

E. අධිකාරී බලය භාවිතා කරමින් අගය කිරීම් බෙදා හැරීම පිළිබඳ ක්‍රීඩාව වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

23. දෙශපාලන විද්‍යාව,

A. රාජ්‍යය, ආණ්ඩුව සහ දේශපාලනය පිළිබඳ හැදෑරීම හා සම්බන්ධ විෂය වේ.

B. මිනිස් ජීවිතයේ ආරම්භය, පැවැත්ම හා අවසානය අධ්‍යයනය කිරීම හා සම්බන්ධ වේ.

C. දර්ශනය, චින්තනය, න්‍යාය සහ මතවාද යන සිව් වැදෑරුම් අංග වලින් යුක්තය.

D. සමාජීය විද්‍යාවක් ලෙස පොදුවේ පිළිගනී.

E. න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශපාලනය අන්තර්ගතය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

24. දේශපාලන විද්‍යාව මගින් හදාරන සංකල්ප කාණ්ඩය වන්නේ,

A. මිනිසාගේ දේශපාලන චර්යාව

B. රාජ්‍ය හා පුරවැසි සම්බන්ධතාවයන්

C. දේශපාලන සිරිත් විරිත්

D. දේශපාලන සමාජානුයෝජනය



DO NOT COPY

E. මානව සමාජ සම්බන්ධතා

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

25. තුලනාත්මක අධ්‍යයන ක්‍රමයට අදාල කාණ්ඩය වන්නේ,

A. අතීත ආණ්ඩුක්‍රම සැසඳීම

B. නව ආණ්ඩුක්‍රම සඳහා කරුණු සෙවීම

C. අතීත දේශපාලන ක්‍රම නූතනයට පැමිණි අයුරු සෙවීම

D. පවතින ආණ්ඩුක්‍රම සැසඳීම

E. පැරණි දේශපාලන විද්‍යා අධ්‍යයන ක්‍රමයක් වීම

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

26. සමාජ විද්‍යා අධ්‍යයන ක්‍රමයේ උපකරණ වන්නේ,

A. සෘජු නිරීක්ෂණ

B. ප්‍රශ්නාවලි

C. සිද්ධි අධ්‍යයන

D. සහභාගිත්ව පරීක්ෂණ

E. මැතිවරණ විශ්ලේෂණ

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

27. දේශපාලනය,

A. සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයක් වේ.

B. මිනිස් ජීවිතයේ සෘජු, අන්‍යෝන්‍ය සහ අත්හළ නොහැකි බැඳීමක් වේ.

C. දේශපාලනයේ විවිධ පැතිකඩ ශාස්ත්‍රීයව හැදෑරීම වේ.

D. දේශපාලනය කිරීම යන පොදු ව්‍යවහාරයන් හැඳින්වේ.

E. දේශපාලන විද්‍යාවේ ප්‍රායෝගික පැතිකඩ ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

28. දේශපාලන විද්‍යාව,

A. ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේදී සම්භාව්‍ය ග්‍රීසියෙන් ආරම්භ වූවකි.

B. ශාස්ත්‍රීය ශික්ෂණයක් ලෙස වර්ධනය වූවක් වේ.

C. බහුවිධ න්‍යාය හා විධික්‍රම භාවිතයට ගනු ලබන ශික්ෂණයකි.

D. දේශපාලනය ප්‍රපංච සහ ගැටලු විද්‍යාත්මකව හැදෑරීම වේ.

E. දේශපාලන කටයුතු ප්‍රායෝගිකව සිදු කිරීමේ කලාව වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

29. ආණ්ඩුකරණයට අයත් වන්නේ,

A. ආගමික සහ සදාචාරාත්මක කටයුතු පාලනය කිරීම.

B. රටේ යහපැවැත්ම අරමුණු කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

C. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාල රාජ්‍ය පරිපාලන කාර්යයන්

D. පුරවැසියන්ට ආරක්ෂාව ලබා දෙමින් නීතිය හා සාමය පවත්වාගෙන යාම

E. අන්තර් රාජ්‍ය සම්බන්ධතා පවත්වාගෙන යාම

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

සාරංග හෙට්ටිආරච්චි
(BA(sp),MA, Political Science – University Of Kelaniya)

DO NOT COPY

30. විද්‍යාත්මක ප්‍රවේශය,

A. ආනුභවික පර්යේෂණ මගින් නව දැනුම නිෂ්පාදනය කරනු ලබන ප්‍රවේශයකි.
B. වටිනාකම් විනිශ්චයන්මෙන් ගෙන් තොර විය යුතු බව පිළිගනී.
C. පෞද්ගලික සහ ආත්මීය නිගමන වලින් නිදහස් විය යුතු ප්‍රවේශයකි.
D. නූතනයේ දාර්ශනික, ඓතිහාසික ප්‍රවේශවලින් බලපෑමට ලක් වී තිබේ.
E. අගය කිරීමේ මූලධර්ම මත පදනම් වූ ප්‍රවේශයකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

31. දේශපාලනය යනු,

A. ආණ්ඩු බලය ලබා ගැනීමට ක්‍රියාකාරී වීම
B. මැතිවරණවලට සහභාගි වීමේ ක්‍රියාවලිය වේ.
C. සටන් හා විරෝධතා ව්‍යාපාර ආදියට සහභාගි වීම වේ.
D. දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වයට සම්බන්ධ වීම වේ.
E. ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

32. දේශපාලන විද්‍යාව,

A. රාජ්‍යය පාලන පිළිබඳ කලාව වේ.
B. බලය සහ අධිකාරීත්වය පිළිබඳ විද්‍යාව වේ.
C. දේශපාලන න්‍යාය හා දර්ශනය පිළිබඳ හදාරන විද්‍යාව වේ.
D. දේශපාලනයේ න්‍යායාත්මක පැතිකඩ හැදෑරීම වේ.
E. ඡන්දදායක චර්යාවේ ප්‍රායෝගික පැතිකඩ වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

33. දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය,

A. ප්ලේටෝ, ඇරිස්ටෝටල් මෙම ප්‍රවේශයේ පුරෝගාමීන් වේ.
B. දේශපාලනය පිළිබඳ අති මූලික ප්‍රශ්න විභාග කරනු ලබන ප්‍රවේශයකි.
C. වටිනාකම් විනිශ්චය කරන ප්‍රවේශයකි.
D. අවසාන අගය කිරීම් වලින් තොර ය.
E. දර්ශනවාදීහු දේශපාලන සංකල්ප වල අර්ථ නිරූපනය කරයි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

34. චර්යාවාදී අධ්‍යයන ප්‍රවේශය,

A. 1920 - 1960 දශකවල අධිපති ධාරාව බවට පත්වූ ප්‍රවේශයකි.
B. නව මාක්ස්වාදය, ස්ත්‍රීවාදය මගින් මෙම ප්‍රවේශය වර්ධනය වී තිබේ.
C. ආනුභවික පර්යේෂණ මගින් අධ්‍යයනය කළ හැකි ක්‍රියාදාමයකි.
D. 1970 දශකයේ දී මෙහි වැදගත්කම අඩු වී තිබේ.
E. මෑත කාලීනව පුරවැසියන්ගේ දේශපාලන සහභාගිත්වය පිළිබඳ ව අධ්‍යයනය කරයි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE



DO NOT COPY

35. දේශපාලන විද්‍යාව සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A. විද්‍යාත්මක ක්‍රම ශිල්ප යොදා ගනිමින් සාර්ථකව අධ්‍යයනය කළ නොහැකි බවය.

B. අග්‍රගණ්‍යය සමාජ විද්‍යාවක් බවය.

C. ස්ථිර නිගමන වලට එළඹීමට නොහැකි බවය.

D. මිනිස් සංහතියේ පරිණාමයේ මූලාරම්භය බවය.

E. පර්යේෂණාගාරය සමස්ත සමාජය වන බවය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

36. දේශපාලනය,

A. ආණ්ඩු බලය ලබා ගැනීමේ තරගකාරී අවස්ථාව වේ.

B. ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීමේ කලාව වේ.

C. නූතනයේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද මගින් පමණක් ක්‍රියාත්මක කළ යුතු යැයි පිළිගනී.

D. සටන් හා විරෝධතා ව්‍යාපාර මඟින් දියත් කරන බල අරගලය වේ.

E. සමනය කළ නොහැකි ප්‍රතිවිරෝධතා හේතුවෙන් හට ගනී.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

37. දේශපාලන විද්‍යාව,

A. දේශපාලනය කිරීම, දේශපාලනය හැදෑරීම යන අංශ දෙකම එයට ඇතුළත් වේ.

B. ශාස්ත්‍රීය ශික්ෂණයක් ලෙස ග්‍රීසියෙන් ආරම්භ වී ඇත.

C. න්‍යාය, විධික්‍රම අතින් බහුවිධ ස්වභාවයක් ගනු ලබන විෂයයකි.

D. රාජ්‍ය මෙන්ම රාජ්‍යයෙන් පරිබාහිර සමාජ වාතාවරණය පිළිබඳව ද හදාරනු ලබයි.

E. හැදෑරීම සඳහා ප්‍රායෝගිකව දේශපාලනය කිරීම අවශ්‍ය නොවේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

38. දේශපාලන විද්‍යාව,

A. මිනිස්සුන්ගේ දේශපාලන චර්යාවන් හා දේශපාලන ක්‍රියාවන් අධ්‍යයනය කරන්නකි.

B. විධිමත් ලෙස අධ්‍යයනය කිරීම ඇරඹුණේ පැරණි ග්‍රීසිය තුළ ය.

C. රාජ්‍ය හා රාජ්‍යයෙන් පරිබාහිර දේශපාලන සාධක අධ්‍යයනය කරයි.

D. ශතවර්ශ 25 කට ආසන්න කාලයක සිට සංවර්ධනය වූ පැරණි ශික්ෂණයකි.

E. දේශපාලනයට අදාළ ඒකීය මතවාද සමූහයක් අධ්‍යනය කරන ශික්ෂණයකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

39. දේශපාලන විද්‍යා අධ්‍යන ප්‍රවේශ මගින්,

A. බහු විශයක ප්‍රවේශය විවිධ ශික්ෂණයන්ගේ පැතිකඩ දේශපාලන විද්‍යාවට සම්බන්ධ වන ආකාරය හදාරයි.

B. වඩාත් හොඳ ආණ්ඩු ක්‍රමයක් ගොඩ නැගීමට ආණ්ඩුක්‍රම සැසඳීම අත්‍යවශ්‍ය බව තුලනාත්මක ප්‍රවේශයෙන් ප්‍රකාශ වේ.

C. සාමාන්‍යකරණය කරන ලද පොදු නිගමනවලට එළඹීම විද්‍යාත්මක අධ්‍යයන ක්‍රමයෙන් සිදු වේ.

D. මාක්ස්වාදය වටා නූතනයේ දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය බද්ධ වී තිබේ.

E. අගය විනිශ්චය, සිතාගැනීම් මත දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය සම්බන්ධ වේ.



DO NOT COPY

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

40. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ,

A. දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වය සහ එමගින් ජනතාවට වන බලපෑම තේරුම් ගැනීමටය.

B. යහපාලනයේ සහ අයහපත් පාලනයේ වෙනස්කම් තේරුම් ගැනීමට ය.

C. රාජ්‍යයේ හා ආණ්ඩුවේ අධ්‍යාත්මක පදනම පිළිබඳ දැන ගැනීමටය.

D. ආණ්ඩුවේ බල අධිකාරී තීරණ ගැනීම හා සම්බන්ධ ක්‍රියාදාමය පිළිබඳ තේරුම් ගැනීමටය.

E. දේශීය හා ජාත්‍යන්තර තලයන්හි බල අරගලය කරන්නා වූ මාර්ග සහ විධික්‍රම තේරුම් ගැනීමට ය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

41. දේශපාලනය,

A. ආණ්ඩුව පිළිබඳ කලාව මෙන්ම විද්‍යාව ද වේ.

B. අගය කිරීම බලාධිකාරි බලය යොදවා බෙදාහරින විධික්‍රමය වේ.

C. සමාජ, ආර්ථික හා දේශපාලන ගැටලු අරබයා පවතින ප්‍රතිවිරෝධතා අදහස් අතර ඇතිවන ගැටුම් වල ප්‍රතිඵලය වේ.

D. ආගමික අගය කිරීම පදනම් කරගත් සමාජයක් ගොඩනගන සදාචාරාත්මක ක්‍රියාවලියක් වේ.

E. දේශපාලන විද්‍යාවේ ප්‍රායෝගික පැතිකඩ වේ.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

42. දේශපාලනය,

A. දේශය පාලනය කිරීමට

B. බලය ක්‍රියාවට නැංවීමේ කලාවය.

C. බලය සඳහා කරන අරගලයයි.

D. මානව ආචාර ධර්මයන්ගේ එකතුවයි.

E. ආණ්ඩු බලය ක්‍රියාත්මක කරයි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

43. දේශපාලනය හැදෑරීම,

A. මැතිවරණ ව්‍යාපාර පිළිබඳ හැදෑරීමයි.

B. පුද්ගලයා දරන පෞද්ගලික ආකල්ප පිළිබඳ හැදෑරීමයි.

C. දේශපාලනය ගැටුම් පිළිබඳ හැදෑරීමයි.

D. වෘත්තීය දේශපාලනඥයන්ගේ චර්යා පිළිබඳ හැරීමයි.

E. ආණ්ඩුවේ ප්‍රතිපත්ති පිළිබඳ හැදෑරීමයි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

44. දේශපාලන විද්‍යාව,

A. සමාජ විද්‍යාවක් ලෙස හඳුන්වයි.

B. ග්‍රීක යුගයෙන් අධ්‍යනය ඇරඹීය.

C. මුල් යුගයේ රාජ්‍යය කේන්ද්‍රය විය.

D. දේශපාලන ශාස්ත්‍රීය ලෙස හැදෑරීමකට ද හේතු වේ.

E. ස්වාභාවික විද්‍යාවන්ට ද නෑකම් කියයි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

සාරංග හෙට්ටිආරච්චි
(BA(sp),MA, Political Science – University Of Kelaniya)

DO NOT COPY

45. දේශපාලන විද්‍යාව යනු,

A. එය පැරණිතම සමාජ විද්‍යා විෂය වේ.

B. එය ගතිකත්වයන් යුතු විෂයයකි.

C. එහි නියමයන් කිසිවිටෙක ස්ථිර නොවේ.

D. එය අනෙකුත් සමාජ විද්‍යාවන් හා බද්ධ වේ.

E. එය විවිධත්වයෙන් තොර වූ ශාස්ත්‍රීයකි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

46. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමෙහි ප්‍රතිඵලයක් වන්නේ,

A. ලෝකය පිළිබඳ ඇති මූලික සංකල්ප පිළිබඳ අවබෝධයක් ලැබීම

B. යහපත් සමාජ ජීවිතයක් ගොඩ නැගීමට

C. ලෝක දේශපාලනය පිළිබඳ හොඳ අවබෝධයක් ලැබීම

D. ආණ්ඩු පෙරළීමට කුමන්ත්‍රණය කිරීම තුළ යහපත් සමාජයක් ගොඩනැගීම

E. දේශපාලන පරිණතභාවයෙන් හෙබි පුද්ගලයකු බවට පත්වීම

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

47. විද්‍යාත්මක ප්‍රවේශය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A. නිවැරදි හා නිශ්චිත තොරතුරු මත පදනම් වීම

B. අතිශයෝක්තිය යොදාගනිමින් වර්ණනා යොදා ගනී.

C. ආනුභවික හා වාස්තවික දත්ත මත පදනම්ව විශ්ලේෂණය කරයි.

D. එහි මූලධර්මය නම් වටිනාකම් විනිශ්චයන්ගෙන් නිදහස් ඥානය යන්නයි.

E. පුද්ගල දේශපාලන චර්යා අධ්‍යනයට විද්‍යාත්මක ප්‍රස්තුත යොදාගනු ලබයි.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

48. දේශපාලන විද්‍යාව,

A. පැරණිතම ශාස්ත්‍රීය ශික්ෂණයකි.

B. ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේ දී ආරම්භ විය.

C. පියා ඇරිස්ටෝටල් ය.

D. ග්‍රීක සම්ප්‍රදායේ ආරම්භකයන් වන්නේ මොන්ටෙස්කිව් හා ජෝන් ලොක් ය.

E. ප්ලේටෝ විසින් රචිත සමූහාණ්ඩුව කෘතිය මේ සඳහා වැදගත් ය.

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

49. දේශපාලන විද්‍යා අධ්‍යයනයේ ප්‍රස්තුතයන්ට අදාළ නොවන්නේ,

A. ආගමික, සාරධර්ම හා සංස්කෘතික වටිනාකම් අධ්‍යයනය කිරීම

B. යුද්ධය හා සාමය

C. වෘත්තිය දේශපාලඥයන්ගේ චර්යාව

D. මැතිවරණ ව්‍යාපාර

E. දේශපාලන ගැටුම් විරෝධතා කැරල

(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE



DO NOT COPY

50. රටක ආණ්ඩුකරණ ක්‍රියාවලියේ අන්තර්ගත ලක්ෂණ වන්නේ,

A. නීති සම්පාදනය

B. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

C. රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණය

D. රාජ්‍ය ආරක්ෂාව සහතික කිරීම

E. අන්තර් සම්බන්ධතා සහ මැදිහත්වීම් ඉවත් කිරීම

F. (1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

51. දේශපාලනය,

1. රාජ්‍ය හා ජනතාව අතර පවතින සම්බන්ධතා ක්ෂේත්‍රයකි.
2. ආණ්ඩුවේ කටයුතුවලට පමණක් සීමා වී තිබේ.
3. යනු රාජ්‍ය සහ ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනය යි.
4. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට පමණක් සීමා වී තිබේ.
5. ආධ්‍යාත්මික ජීවිතය කළමනාකරණය පිළිබඳ සැලකිලිමත් වේ.

52. දේශපාලනය අධ්‍යයනය කිරීම,

1. සෑමවිටම ප්‍රතිමානීය විමර්ශනයට සීමා වී ඇත.
2. බල අරගලය හැදෑරීමට පමණක් සීමා වී ඇත.
3. විද්‍යාත්මක විමර්ශනය පමණක් ලක්ෂණ කොට ගෙන ඇත.
4. ස්වභාවික විද්‍යාවන්ගේ මට්ටම මුහුකුරා ගොස් ඇත.
5. විද්‍යාත්මක හා ප්‍රතිමානීය ලෙස සලකා බැලීම දෙකෙන් සමන්විතය..

53. දේශපාලනය යනු,

1. මැතිවරණ ක්‍රියාවලියට සීමා වූ භාවිතයකි.
2. ආණ්ඩු ක්ෂේත්‍රයට පමණක් සීමා වූ බල තරගයකි.
3. සමාජ විද්‍යාවන්ට මෑත කාලයේ එකතු වූ සංකල්පයකි.
4. රාජ්‍යය හා සමාජය අතර පවතින බල සම්බන්ධතාවයකි.
5. රාජ්‍ය පරිපාලනයට සීමා වූ ක්‍රියාවලියකි.

54. දේශපාලන විද්‍යා අධ්‍යන ප්‍රවේශ සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1. දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය මෑත කාලීනව දේශපාලන විද්‍යාව අධ්‍යනයට යොදා ගන්නා ලදී.
2. තුලනාත්මක දේශපලන අධ්‍යායන ප්‍රවේශය තුළ ධාරාවන් තුනක් පවතී.
3. බහු විෂයික ප්‍රවේශයෙන් දේශපාලන විද්‍යාව හුදකලා විෂයක් බව පෙන්වා දෙයි.
4. විද්‍යාත්මක චර්යාවාදී ප්‍රවේශය තුළ දේශපාලන විද්‍යාව උපකල්පනයක් මත අධ්‍යනය කරයි.

DO NOT COPY

5. ස්ත්‍රීවාදී අධ්‍යයන ප්‍රවේශය මගින් පුරුෂ කේන්ද්‍රීය සමාජය හා දේශපාලන පැතිකඩ අගය කරයි.

55. දේශපාලන විද්‍යාව යනු,

1. විද්‍යාත්මක ක්‍රම මගින් පමණක් අධ්‍යයනය කළ හැකි විෂයකි.
2. ස්වාභාවික විද්‍යාවන් සමග බැඳී පවතින විෂයකි.
3. න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් කොටස් 02 කි.
4. රාජ්‍ය පිළිබඳව පමණක් ශාස්ත්‍රීය හැදෑරීම සිදු කරයි.
5. එක් න්‍යායක් හා විධික්‍රම රාශියක් ඇති විෂයකි.

56.දේශපාලනය යනු,

1. දේශපාලන විද්‍යාවේ න්‍යායාත්මක පැතිකඩ වේ.
2. රාජ්‍ය, ආණ්ඩුව හා රාජ්‍ය පරිපාලනය පමණක් හදාරනු ලබයි.
3. දේශය පාලනය කිරීම යන්න දිය හැකි පරිපූර්ණ අර්ථ කථනයකි.
4. පුරවැසි සහභාගීත්වයට ද වැදගත් තැනක් ලබා දෙන්නකි.
5. ආණ්ඩු ක්ෂේත්‍රයට පමණක් සීමා වූ බල අරගලයකි.

57. විද්‍යාත්මක ප්‍රවේශය

1. 19 වැනි හා 20 වැනි සියවසේ දී දේශපාලන විද්‍යාවට එකතු වූ සංකල්පයකි.
2. වටිනාකම් විනිශ්චයන්ගෙන් තොර සංකල්පයකි.
3. හොඳ , නරක හා යහපත, අයහපත ගැන සලකමින් අධ්‍යයනය කිරීම සිදු කළ යුතුය.
4. සාක්ෂ්‍ය හා දත්ත මත අධ්‍යයනය කිරීමෙන් විද්‍යාත්මක ස්වභාවයට හානියක් පැමිණේ.
5. 1970 දශකයේ දී මෙය අධිපති ධාරාව ලෙස භාවිත විය.

58. දේශපාලනය

1) රාජ්‍ය හා ජනතාව අතර පවතින සම්බන්ධතා ක්ෂේත්‍රයකි
2) ආණ්ඩුවේ කටයුතුවලට පමණක් සීමා වේ
3) රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනයකි
4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට පමණක් සීමා වී තිබේ
5) ආධ්‍යාත්මික ජීවිතය කළමණාකරණය පිළිබඳ සැලකිලිමත් වේ

59. දේශපාලන විද්‍යාව

1) මිනිසුන්ගේ එදිනෙදා සමාජීය ක්‍රියාකාරකම් හැදෑරීමේ විෂයයි
2) ස්වාභාවික විද්‍යාවන් සමඟ බැඳී පවතින විෂයයි
3) දේශපාලනය යන්න ශාස්ත්‍රීය ලෙස හැදෑරීමේ විෂයයි
4) සාරධර්ම හා ආධ්‍යාත්මික ගුණාංග දියුණු කිරීමේ විෂයයි
5) එක් න්‍යායක් හා විධික්‍රමයක් සහිත විෂයකි

60. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර පවතින සම්බන්ධය

1) ප්‍රධාන පැති තුනකින් සමන්විතය
2) දේශපාලනය කිරීම යනු දේශපාලනය හැදෑරීමකි

DO NOT COPY

3) දේශපාලනය හැදෑරීමෙන් ප්‍රායෝගිකවදේශපාලනය සිදු කරන බව අදහස් වේ
4) දේශපාලනය හැදෑරීමෙන් ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු වේ
5) දේශපාලන අධ්‍යයනය පුළුල් ක්ෂේත්‍රයක පැතිරී ඇත

සාරංග හෙට්ටිආරච්චි
(BA(sp),MA, Political Science – University Of Kelaniya)

DO NOT COPY